ආනන්ද විද්‍යාලය, කොළඹ 10. Ananda College, Colombo 10.

ආනන්ද විද්‍යාලය - කොළඹ 10.

08 | S | I

පළමු වාර පරීක්ෂණය - 2023 ජූලි

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

කෘෂි විද්‍යාව - I
Agricultural Science - I

12 ශ්‍රේණිය

පැය 01 යි
One hour

උපදෙස් :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ නම ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 01 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

01. ව්‍යාන්තිකරණය නැමැති ක්‍රියාවලිය සඳහා හේතුවන දේශගුණික සාධකය වනුයේ,
(1) වර්ෂාපතනයයි. (2) සුළඟේ වේගයයි. (3) ආලෝක තීව්‍රතාවයයි.
(4) උෂ්ණත්වයයි. (5) ආලෝකය පැවති කාලසීමාවයි.

02. පාංශු ඛාදනය අවම කළ හැකි නවීන ජල සම්පාදන ක්‍රමයක් වනුයේ,
(1) තීරු ජල සම්පාදනයයි. (2) වළලු ජල සම්පාදනයයි. (3) පිටාර ජල සම්පාදනයයි.
(4) බේසම් ජල සම්පාදනයයි. (5) බිංදු ජල සම්පාදනයයි.

03. පස් සාම්පලයක සත්‍ය ඝනත්වය $2.4\ gcm^{-3}$ හා දෘෂ්‍ය ඝනත්වය $1.5\ gcm^{-3}$ නම් එම පසේ සච්ඡිද්‍රතාවය වනුයේ,
(1) 35.7% යි. (2) 37.5% යි. (3) 60.0% යි.
(4) 62.5% යි. (5) 65.2% යි.

04. උතුරු නැගෙනහිර හා වයඹ පළාතේ වෙරළාසන්න ප්‍රදේශවල තීරුවක් ලෙස පැතිර ඇති පස් කාණ්ඩය වනුයේ,
(1) රතු කහ ලැටසෝල්ය. (2) රතු කහ පොඩ්සොලික්ය. (3) රතු දුඹුරු පසය.
(4) දියළු පසය. (5) චූර්ණමය නොවන දුඹුරු පසය.

05. ජිප්සම් කුට්ටි ක්‍රමයෙන් මනිනු ලබන්නේ,
(1) පසෙහි අඩංගු ජලයේ pH අගයයි. (2) පාංශු තෙතමන ප්‍රමාණයයි.
(3) පසෙහි අඩංගු ජලාකර්ශක ජල ප්‍රමාණයයි. (4) පාංශු සච්ඡිද්‍රතාවයයි.
(5) පාංශු ආම්ලිකතාවයයි.

06. පාංශු පැතිකඩකින් ජලය ඉවත්වන ප්‍රධාන ආකාර වනුයේ,
(1) වාෂ්පීකරණය සහ උත්ස්වේදනයයි. (2) ජලවහනය සහ කාන්දුවීමයි.
(3) ගැඹුරු වැස්සීම සහ වාෂ්පීකරණයයි. (4) උත්ස්වේදනය සහ වැස්සීමයි.
(5) අපධාවය හා කාන්දුවීමයි.

07. ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප වර්ගීකරණයට අනුව WL_1 යන සංකේතවලින් පිළිවෙලින් දැක්වෙනුයේ,
(1) පහතරට තෙත් කලාපය සහ තෙතමන පරාසයයි.
(2) මැදරට වියළි කලාපය සහ මාසික වර්ෂාපතනයේ ස්ථානීය අගයයි.
(3) උඩරට තෙත් කලාපය සහ වර්ෂාපතන ව්‍යාප්තියයි.
(4) පහතරට වියළි කලාපය සහ තෙතමන පරාසයයි.
(5) පහතරට අතරමැදි කලාපය සහ වාර්ෂික වර්ෂාපතන ව්‍යාප්තියයි.

08. පසක පවතින අම්ලකාරක කැටායන වනුයේ,
(1) කැල්සියම් හා මැග්නීසියම්ය. (2) සෝඩියම් හා පොටෑසියම්ය.
(3) හයිඩ්‍රජන් හා ඇලුමිනියම්ය. (4) හයිඩ්‍රජන් හා සෝඩියම්ය.
(5) පොටෑසියම් හා කැල්සියම්ය.

Ananda College Maths Section Exam Management Unit

09. භාරමිතික ක්‍රමයෙන් පාංශු ජල ප්‍රතිශතය සෙවීමේ ක්‍රියාකාරකමකදී ලබාගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

ක්ෂේත්‍රයෙන් ලබාගත් පස් සාම්පලයේ ස්කන්ධය = 75 g

105 °C උෂ්ණත්වයේ වියලූ පස් සාම්පලයේ ස්කන්ධය = 60 g

පස් සාම්පලයේ තෙතමන ප්‍රතිශතය වනුයේ,

(1) 15% කි. (2) 20% කි. (3) 25% කි.
(4) 75% කි. (5) 80% කි.

10. කාලගුණ මධ්‍යස්ථානයක ස්වයංක්‍රීය වර්ෂාමානයෙන් මනිනු ලබන්නේ,

(1) තෙතමන පරාසයයි.
(2) වර්ෂාපතන ප්‍රමාණයයි.
(3) ආලෝකය පැවති කාලසීමාව හා වර්ෂාපතන තීව්‍රතාවයයි.
(4) වර්ෂාපතන තීව්‍රතාවය සහ වර්ෂාපතනය පැවැත්වූ කාලසීමාවයි.
(5) වර්ෂාපතනය පැවැත්වූ කාලසීමාව සහ සාමාන්‍ය වර්ෂාපතනයයි.

11. ශ්‍රී ලංකාවට දිගම දිවා කාලයක් ලැබෙනුයේ,

(1) මාර්තු 21 වෙනිදය. (2) අප්‍රේල් 21 වෙනිදය. (3) ජූනි 21 වෙනිදය.
(4) අගෝස්තු 21 වෙනිදය. (5) දෙසැම්බර් 21 වෙනිදය.

12. බෑවුම් සහිත භූමියක සමෝච්ච රේඛා සටහන් කිරීමට වඩාත් උචිත උපකරණය වනුයේ,

(1) ප්ලැනිමීටරයයි. (2) මිනුම් පටියයි. (3) මීටර් දම්වැලයි.
(4) ලඹ නූලයි. (5) A රාමුවයි.

13. එළවළු බෝගයක පටක මාංශල වීම, පර්ව දික්වීම හා අධිකව පළිබෝධ හානිවලට ගොදුරු වීමට හේතුව වනුයේ ශාකයට,

(1) පොටෑසියම් පෝෂකය ඌන වීම නිසාය.
(2) නයිට්‍රජන් පෝෂකය අධික වීම නිසාය.
(3) කැල්සියම් පෝෂකය විෂවීම නිසාය.
(4) පොස්පරස් පෝෂකය ඌන වීම නිසාය.
(5) යකඩ පෝෂකය විෂවීම නිසාය.

14. ශ්‍රී ලංකාවේ බොහෝ පස් කාණ්ඩවල දක්නට ලැබෙන පාංශු වයන පන්තිය වනුයේ,

(1) වැලිමය මැටි ලෝම වයන පන්තියයි.
(2) රොන්මඩ ලෝම වයන පන්තියයි.
(3) වැලිමය මැටි වයන පන්තියයි.
(4) වැලිමය ලෝම වයන පන්තියයි.
(5) මැටි ලෝම වයන පන්තියයි.

15. කාලගුණික මධ්‍යස්ථානයක් පිහිටුවීම සම්බන්ධයෙන් වන පහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි වනුයේ,

(1) ජලාශ හෝ පොකුණු ආසන්නයේ පිහිටුවිය යුතුය.
(2) බාහිර බාධකවලින් තොර සෙවන ලැබෙන ස්ථානයක පිහිටුවිය යුතුය.
(3) නිරාවරණය වූ විවෘත ස්ථානයක $5\ m \times 5\ m$ ක්ෂේත්‍රඵලයක පිහිටුවිය යුතුය.
(4) ප්‍රදේශයේ භෞතික සහ භූ විද්‍යාත්මක ලක්ෂණ නියෝජනය කරන ස්ථානයක පිහිටුවිය යුතුය.
(5) ජලවහනය සතුටුදායක අහඹු රළු බව වැඩි ස්ථානයක් සුදුසුය.

16. ක්ෂාරීය පසක සුලභව තිබිය හැකි මූලද්‍රව්‍ය වනුයේ,

(1) Fe ය. (2) Mn ය. (3) Mo ය.
(4) B ය. (5) Al ය.

17. ප්‍රකාශවර්තිතාවය සෘජුවම බලපාන ශාක කායික ක්‍රියාවලිය වනුයේ,

(1) පුෂ්පීකරණයයි. (2) උත්ස්වේදනයයි. (3) ප්‍රභාසංස්ලේෂණයයි.
(4) බීජ ප්‍රරෝහණයයි. (5) ආකන්ධ වර්ධනයයි.

18. පාංශු ජනනය කෙරෙහි බලපාන ප්‍රධාන දේශගුණික සාධක වන්නේ,

(1) සුළඟ සහ උෂ්ණත්වයයි.
(2) ආලෝකය සහ උෂ්ණත්වයයි.
(3) සාපේක්ෂ ආර්ද්‍රතාවය සහ උෂ්ණත්වයයි.
(4) උෂ්ණත්වය සහ වර්ෂාපතනයයි.
(5) වාෂ්පීකරණය සහ සුළඟයි.

✍.....3

Ananda College Maths Section Exam Management Unit

19. ඛනිජමය මූලද්‍රව්‍ය සම්බන්ධයෙන් වන පහත වගන්ති සලකා බලන්න.
A - සමාන ලක්ෂණ සහිත වෙනත් මූලද්‍රව්‍ය මගින් ඛනිජමය මූලද්‍රව්‍ය ප්‍රතිස්ථාපනය කළ නොහැකිය.
B - ඛනිජමය මූලද්‍රව්‍ය නොමැති වූ විට සාමාන්‍ය ලෙස වර්ධනය වී ශාකයේ ජීවන චක්‍රය සම්පූර්ණවීම වළක්වයි.
C - මේවා සියල්ලම ශාක පරිවෘත්තිය සඳහා ඍජුවම සහභාගි නොවන මූලද්‍රව්‍ය වේ.
ඉහත වගන්ති අතරින් ශාක පරිවෘත්තිය සඳහා ඛනිජමය මූලද්‍රව්‍යවල අවශ්‍යතාව පෙන්නුම් කරන වගන්තිය වනුයේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා C පමණි. (5) A හා B පමණි.

20. පාංශු සංරක්ෂණය සඳහා යොදගන්නා ශෂ්‍ය විද්‍යාවේ මූලික සිද්ධාන්තයක් වනුයේ,
(1) පස හා දේශගුණය පාලනය කිරීම.
(2) සමෝච්ච රේඛා අනුව පස් වැටි දැමීම.
(3) හෙල්මළු තැනීම.
(4) සැවැන්දරා සිටුවීම.
(5) බෝග වගා ක්‍රම භාවිතය

21. සියලුම ශාකවලට අත්‍යාවශ්‍ය වන පෝෂකයක් වනුයේ,
(1) Na ය. (2) V ය. (3) Si ය. (4) Mo ය. (5) F ය.

22. ශ්‍රී ලංකාවේ වැඩිම බිම් ප්‍රමාණයක වගා කර ඇති බෝගය වනුයේ,
(1) තේ ය. (2) පොල් ය. (3) වී ය.
(4) රබර් ය. (5) කුරුඳු ය.

23. පාංශු වයනය නිරීක්ෂණය කළ ශිෂ්‍යයෙක් එය මැටි සහිත පසක් බව නිගමනය කළේය. එම පස සෑදුනු මාතෘ පාෂාණයේ බහුලව අඩංගු ඛනිජය විය හැකි වනුයේ,
(1) මයිකාය. (2) ඩොලමයිට්ය. (3) ක්වෝට්ස්ය.
(4) ඇපටයිට්ය. (5) පෙල්ස්පාර්ය.

24. රතු කහ පොඩ්සොලික් පසේ වගා කිරීමේදී මතුවන ගැටලුවක් වනුයේ,
(1) ආම්ලිකතාවය සහ කැල්සියම්, මැග්නීසියම් පෝෂක හිඟවීමයි.
(2) විසිරී ගිය පාංශු ව්‍යුහය හේතුවෙන් ජලවහනය දුර්වල වීමයි.
(3) පාංශු පැතිකඩේ B කලාපයේ තිරුවානා ගල් තට්ටුවක් පැවතීමයි.
(4) මතුපිට පස තරමක් ආම්ලික වීම හා යටි පස ක්ෂාරීය වීමයි.
(5) ජලය රඳා ගැනීම අඩු නිසා නිතර ජල සම්පාදනය කළ යුතු වීමයි.

25. අන්තර් නිවර්තන අභිසාරී කලාපය ශ්‍රී ලංකාවෙන් දකුණු දෙසට විස්ථාපනය වන්නේ,
(1) වායු පීඩන අවපාත මගිනි.
(2) සංවහන සුළං ධාරා මගිනි.
(3) අන්තර් මෝසම් කාලවලදීය.
(4) ඊසානදිග මෝසම් සුළං මගිනි.
(5) නිරිතදිග මෝසම් සුළං මගිනි.

Ananda College Maths Section Exam Management Unit

ආනන්ද විද්‍යාලය, කොළඹ 10. Ananda College, Colombo 10.

ආනන්ද විද්‍යාලය - කොළඹ 10.

08 | S | II

පළමු වාර පරීක්ෂණය - 2023 ජූලි

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

කෘෂි විද්‍යාව - II
Agricultural Science - II

12 ශ්‍රේණිය

කාලය පැය $1\frac{1}{2}$ යි.
$1\frac{1}{2}$ hours

උපදෙස් :

වැදගත්

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 07 ක් සහිතව **A** සහ **B** යන කොටස් දෙකකින් යුක්ත වේ.
- **A කොටස - ව්‍යුහගත රචනා (02 - 06 පිටු)**
  සියලුම ප්‍රශ්නවලට පිළිතුරු, මෙම පත්‍රයේ ම සපයන්න.
  ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.
- **B කොටස - රචනා (07 පිටුව)**
  සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න.
  සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ **B** කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

(08) කෘෂි විද්‍යාව **II**		
කොටස	ප්‍රශ්න අංකය	ලැබූ ලකුණු
A	1	
	2	
B	3	
	4	
එකතුව		
ප්‍රතිශතය		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරින්	

සංකේත අංක

උත්තර පත්‍ර පරීක්ෂක		
පරීක්ෂා කළේ:	1	
	2	
අධීක්ෂණය		

Ananda College Maths Section Exam Management Unit

A කොටස - ව්‍යුහගත රචනා

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. A. පස මතුපිට සිට හාරන ලද වළක් දක්නට ලැබෙන පාංශු පැතිකඩක් පහත දැක්වේ.

(i) පාංශු පැතිකඩෙහි කාබනික ද්‍රව්‍ය අඩංගු පාංශු ස්ථරය/ස්ථර නම් කරන්න.

(ii) විශෝධන කලාපය ලෙස හඳුන්වන පාංශු ස්ථරයද නම් කරන්න.

(iii) ඉහත රූපයේ දැක්වෙන පාංශු පැතිකඩේ පාංශු ගැඹුර සඳහන් කරන්න.

(iv) පාංශු පැතිකඩක් සංවර්ධනය වීමට බලපාන ප්‍රධාන සාධක හතරක් නම් කරන්න.

B. පසේ පවතින ද්‍රව මාධ්‍යය ජලයයි.

(i) ක්ෂේත්‍රයේ දී පාංශු තෙතමනය මැනීමට යොදගත හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(ii) පසෙන් ජලය හානිවන ආකාරයන් දෙකක් සඳහන් කර එම එක් එක් ආකාරයෙන් ජලය හානිවීම වළක්වා ගත හැකි ක්‍රමය බැගින් සඳහන් කරන්න.

ජලය හානිවන ආකාරය	වළක්වා ගන්නා ක්‍රමය

(iii) ශාකයට ලබාගත හැකි ජලය අඩංගු වන pF පරාසය සඳහන් කරන්න.

C. පාංශු කලිලවලට පෝෂක රඳවා ගැනීමේ සහ පැළෑටියනට පෝෂක ලබාදීමේ හැකියාවක් ඇත.

(i) පාංශු කලිලවලට පොදු ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

Ananda College Maths Section Exam Management Unit

(ii) පාංශු කලිල සංකීර්ණයක පවතින ප්‍රධාන කලිල ආකාර **දෙක** නම් කරන්න.

....

....

D. පාංශු ප්‍රතික්‍රියාවේ නිර්ණායක ලෙස උපයෝගී කර ගන්නේ pH අගය නම් පරාමිතියයි.

(i) පාංශු pH අගය නිර්වචනය කරන්න.

....

....

(ii) පාංශු pH අගය අධික ආම්ලික වූ විට ද්‍රාව්‍යතාවය ඉහළ යන ශාක පෝෂක **දෙකක්** නම් කරන්න.

....

....

(iii) ආම්ලික පසක් යථා තත්ත්වයට පත් කර ගැනීමට යොදගත හැකි ද්‍රව්‍යයන් **දෙකක්** නම් කරන්න.

....

....

....

(iv) ලවණතාව සහිත පසක ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

....

....

....

E. පාංශු ඝන ද්‍රව්‍ය මගින් පසේ සැකිල්ල නිර්මාණය කරයි.

(i) ශ්‍රී ලංකාවේ පස්වල සුලභව දක්නට ලැබෙන සිලිකේට් ඛනිජ වර්ග **දෙක** නම් කරන්න.

....

....

(ii) කැටායන හුවමාරු ධාරිතාවය ඉහළ ද්විතියික ඛනිජයක් නම් කරන්න.

....

F. ශාකවල වර්ධනය සඳහා පාංශු ජීවීන් විවිධාකාරයෙන් බලපායි.

(i) ශරීරයේ පළල අනුව පාංශු ජීවීන් වර්ගීකරණය කර ඇති කාණ්ඩ **තුන** නම් කරන්න.

....

....

....

(ii) රනිල ශාකවල නයිට්‍රජන් තිර කරන බැක්ටීරියා විශේෂයක් නම් කරන්න.

....

(iii) "දිලීරක මූලය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි සඳහන් කරන්න.

....

Ananda College Maths Section Exam Management Unit

02. (A) (i) පාසලේ කාලගුණික දත්ත ලබා ගැනීම සඳහා යොදගන්නා පහත දී ඇති උපකරණ හා එම එක් එක් උපකරණය භාවිතයෙන් ලබාගන්නා පරාමිතික නම් කරන්න.

උපකරණයේ නම	පරාමිතිකය
(a) සුළං දිශා දර්ශකය	....
(b) වාෂ්පීකරණ තැටිය	....
(c) සූර්ය දීප්තමානය	....
(d) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය	....

(ii) අනිලමානයෙන් ලබා ගන්නා පරාමිතකයේ ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

....

....

(iii) කෘෂි විද්‍යාවට අදළ දත්ත ලබාගැනීමට අනිලමානය පිහිටුවීමේ දී සැලකිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

....

....

(iv) කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක් පිහිටුවිය හැකි ස්ථානයක තිබිය යුතු විශේෂ ලක්ෂණ තුනක් ලියන්න.

....

....

....

(B) ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප 46 කට බෙදූ ඇත.

(i) අලුත් වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයට යොදගෙන ඇති පදනම සඳහන් කරන්න.

....

....

(ii) මෙරට අතරමැදි කලාපයේ දැකිය හැකි කෘෂි පාරිසරික කලාප ගණන සඳහන් කරන්න.

....

(iii) කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

....

....

....

(C) (i) ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය හට ගන්නා කාලසීමාවන් සඳහන් කරන්න.

	කාලසීමාව
(a) පළමුවැනි අන්තර් මෝසම් වැසි	....
(b) දෙවැනි අන්තර් මෝසම් වැසි	....
(c) ඊසානදිග මෝසම් වැසි	....
(d) නිරිතදිග මෝසම් වැසි	....

(ii) ශ්‍රී ලංකාවේ පවතින මෙම වාර්ෂික වර්ෂාපතන රටාව නම් කරන්නේ කෙසේද?

....

Ananda College Maths Section Exam Management Unit

(iii) හෙක්ටාර 02 ක භූමියකට 20 mm වර්ෂාපතනයක් ලැබුනේ නම් එම භූමියට ලැබුණු ජල පරිමාව ඝන මීටර්වලින් ගණනය කරන්න.

....

....

....

(iv) අධික වර්ෂාපතනයෙන් බෝග වගාවට සිදුවන හානිකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

....

....

(D) (i) පහත දක්වා ඇති උපකරණයේ කොටස් නම් කරන්න.



A. ....

B. ....

C. ....

(ii) සූර්යාලෝකය කඩින් කඩ ලැබී ඇති දිනක B හි සටහන් වන ආකාරය ඇඳ දක්වන්න.

(iii) පුෂ්පකරණයේදී වැඩි ආලෝක කාලසීමාවකට ප්‍රතිචාර දක්වන ශාක දෙකකට නිදසුන් ලියන්න.

....

....

(E) (i) බෝග වගාව සඳහා සුදුසු සරු පසක තිබිය යුතු ලක්ෂණ තුනක් දක්වන්න.

....

....

....

(ii) පාංශු සරු බව අඩුවීමට හේතුවන කරුණු තුනක් නම් කරන්න.

....

....

....

Ananda College Maths Section Exam Management Unit

(iii) පසේ සරු බව නැවත සංස්ථාපනය කිරීමේදී පසේ ඇතිවන ප්‍රධාන භෞතික වෙනස්කම් දෙකක් දක්වන්න.

....

....

(F) ශාකයක වර්ධනයට අත්‍යාවශ්‍ය මූලද්‍රව්‍ය ශාක පෝෂක ලෙස හැඳින්වේ.

(i) යම් මූලද්‍රව්‍යයක් ශාක පෝෂණය සඳහා අත්‍යාවශ්‍ය වීමට සපුරාලිය යුතු නිර්ණායක තුනක් නම් කරන්න.

....

....

....

(ii) චල හා අචල මූලද්‍රව්‍ය දෙක බැගින් නම් කරන්න.

චල මූලද්‍රව්‍ය 1. .... 2. ....

අචල මූලද්‍රව්‍ය 1. .... 2. ....

(iii) නයිට්‍රජන් පෝෂකය පසට ලැබෙන ආකාර දෙකක් සහ පසෙන් ඉවත්වන ආකාර දෙකක් සඳහන් කරන්න.

(a) නයිට්‍රජන් පසට ලැබෙන ආකාර

....

....

(b) නයිට්‍රජන් පසෙන් ඉවත් වන ආකාර

....

....

Ananda College Maths Section Exam Management Unit

ආනන්ද විද්‍යාලය - කොළඹ 10. Ananda College, Colombo 10.

08 S II

පළමු වාර පරීක්ෂණය - 2023 ජූලි

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024

කෘෂි විද්‍යාව - II

Agricultural Science - II

12 ශ්‍රේණිය

B කොටස - රචනා

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

03. (i) කෘෂි කාලගුණ ඒකකයක් තුළ උපකරණ ස්ථානගත කරන ආකාරය දළ සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) පස සෑදීමේ ක්‍රියාවලියට බලපාන සාධක විස්තර කරන්න.

(iii) බෝග වගාව කෙරෙහි පාංශු ජීවීන්ගේ වැදගත්කම විස්තර කරන්න.

04. (i) බෝග අස්වැන්නට බලපාන ප්‍රධාන දේශගුණික සාධක නම් කර එම සාධක බෝග අස්වැන්නට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ii) පාංශු සෞඛ්‍යයට බලපාන රසායනික, භෞතික හා ජීව විද්‍යාත්මක සාධක මොනවාදැයි පැහැදිලි කරන්න.

(iii) පාංශු ඛාදනයේ හානිකර බලපෑම් විස්තර කරන්න.

Ananda College Maths Section Exam Management Unit